# ක්‍රිස්තු වර්ෂ හයවන සියවස සහ නවවන සියවස අතර කාලයේ ශ්‍රී ලංකාව සහ පල්ලව දේශය අතර පැවති බෞද්ධාගමික සබඳතා පිළිබඳ ඓතිහාසික විමර්ශනයක්.

සු. ධර්මරත්න

*ඉතිහාසය අධ්‍යයනාංශය, ශාස්ත්‍ර පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය.*

ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර සංස්කෘතික සබඳතාවයන්හි ඉතිහාසය සාහිත්‍යමය මූලාශ්‍ර පාර්ශවයට අනුව ක්‍රි. පූ. යුගය දක්වා ඈතට සම්බන්ධ වේ. අර්ධද්වීපික ඉන්දියාව සහ ලංකාව අතර බෞද්ධාගමික සබඳතාවන් ඒ හා සම්බන්ධ කිරීමට වංශකථාකරුවන් මැලිකමක් දැක්වූ නමුත් පුරාවිද්‍යාත්මක සාධක මගින් එය සනාථ වී තිබේ. ක්‍රි. ව. හයවන සියවසේදී අර්ධද්වීපික ඉන්දියාවේ දේශපාලන ස්ථාවර බවක් හිමිකරගත් පල්ලවයින්ගේ සංස්කෘතික කටයුතු අතර බෞද්ධාගමට විශේෂ තැනක් හිමි වේ. ශ්‍රී ලාංකික බෞද්ධ සංස්කෘතිය කෙරෙහි මෙහි බලපෑම් දැඩිව ලද බවට තොරතුරු හමු වේ. විශේෂයෙන් පුරාවිද්‍යාත්මක සාක්ෂි පදනම් කොට ගෙන පල්ලව රාජ්‍යයත් ශ්‍රී ලංකාවත් අතර පැවති බෞද්ධාගමික සබඳතා පිළිබඳව තුලනාත්මක, ඓතිහාසික විමර්ශනයක් කිරීම මෙම පර්යේෂණයේ මූලික පරමාර්ථය වේ.

මෙම පර්යේෂණයේ මූලික අරමුණු අංග කීපයක් ඔස්සේ අධ්‍යයනය කිරීමට බලාපොරොත්තු වෙමි. සාහිත්‍යමය මූලාශ්‍ර පාර්ශවයෙන් මතු කෙරෙන ලංකාවත් පල්ලව දේශයත් අතර පැවති මහායාන සබඳතාවන්හි යථාස්වභාවය විමසීමත්, එම සබඳතාව මෙම ප්‍රදේශ දෙකෙහිත් අතිරේකව වෙනත් රාජ්‍යයන්හිත් විසූ බෞද්ධ ප්‍රජාව තුළ මහායාන බෞද්ධාගම තහවුරු වීම කෙරෙහි කොතෙක් දුරට බලපා තිබේ දැයි අධ්‍යයනය කිරීමත් මෙහි මූලික පරමාර්ථයයි.

එමෙන්ම මෙම අවධියට අයත් ශ්‍රී ලංකාවේ පවත්නා වාස්තු විද්‍යාත්මක ලක්ෂණ හා කලාත්මක අංග හැඩ ගැස්වීම සඳහා සුවිශේෂ දායකත්වයක් පල්ලව-ශ්‍රී ලංකා බෞද්ධාගමික සබඳතාවයෙන් ලැබී ඇති බව පැහැදිලි කරුණකි. ඒ නිසා මෙම සබඳතාව කිනම් ආකාරයකට උක්ත සාක්ෂි මගින් සනාථ කළ හැකි දැයි විමර්ශනය කිරීමට ද මෙහිදී බලාපොරොත්තු වෙමි. පල්ලව ග්‍රන්ථාක්ෂරවල ස්වරූපය කොතෙක් දුරට ශ්‍රී ලාංකික බ්‍රාහ්මී අක්ෂර රටාව හැඩගැස්වීම කෙරෙහි බලපා තිබේ ද යන්න විමසීම තුළින් ද දෙරට අතර පැවති සංස්කෘතික සබඳතාවේ ස්වභාවය ගැන නිගමනවලට එළඹීමට මං විවර වේ.

සාහිත්‍යමය සහ පුරාවිද්‍යාත්මක සාක්ෂි සංසන්දනාත්මකව විමසන විට පල්ලව-ශ්‍රී ලංකා සබඳතාව මහායාන මතවාදයනට යම් පදනමක් මෙරට තුළ ස්ථාපිත කිරීම කෙරෙහි බලපෑ බවක් පෙනේ. ථේරවාදී අදහස් දැඩිව ග්‍රහණයට ලක් වූ ශ්‍රී ලංකාව තුළ මහායානික අදහස් සියුම්ව බෞද්ධ සමාජයට ඇතුළත් කරලීමට ද පල්ලව-ශ්‍රී ලංකා සබඳතාවය ඇති කළ සංස්කෘතික පරිසරය අතිශයින්ම ඉවහල් වී යැයි කීම නිවැරදිය.